# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ඉහත තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ II ශ්‍රේණියේ විදුලි සංදේශ නිලධාරී තනතුරට බඳවා ගැනීම - අභ්‍යන්තර

- තාක්ෂණික ප්‍රමිතීන් සහ අනුකූලතා පරීක්ෂණ පැවැත්වීම.
- නිරෝධන මැනීම , ක්ෂේත්‍ර ශක්තිය සහ බල මිනුම් පිළිබඳ කාර්යයන්හි නිරත වීම.
- තාක්ෂණික විමර්ශන පැවැත්වීම සහ වාර්තා ඉදිරිපත් කිරීම.
- තාක්ෂණික උපකරණ මිලදී ගැනීම සහ අනෙකුත් අදාළ ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ රාජකාරි සහ කාර්යයන් ඉටු කිරීමේදී කළමනාකාරිත්වයට සහාය වීම.

**(2) අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම්:**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයකින් පිරිනමනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 මට්ටමට හෝ ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) 3 මට්ටමට නොඅඩු ඉලෙක්ට්‍රොනික හෝ විදුලි සංදේශ පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ කටුබැද්ද ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) ඩිප්ලෝමාව හෝ ඊට සමාන හෝ උසස් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.

**සහ**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආශ්‍රිත, මෙහෙයුම්, කළමනාකරණ සහකාර, තාක්ෂණික හෝ ප්‍රාථමික මට්ටමේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 04ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම .

**(3) <u>බඳවා ගැනීමේ පටිපාටිය</u>**

ලිඛිත තරඟ විභාගයකින් අනතුරුව පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කෙරේ. තරඟ විභාගයේ සමස්ථ ලකුණු සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් කුසලතා අනුපිළිවෙල මත පමණක් පත්වීම් සිදු කෙරේ.

<u>ලිඛිත විභාගයේ විෂයයන්</u>
අ) භාෂා ප්‍රවීණතාවය සහ බුද්ධි පරීක්ෂණය - පැය 2 යි
ආ) තනතුරට අදාළ විෂය දැනුම - පැය 2 යි

බඳවා ගැනීමේ විභාගය සමත් වීම සඳහා, එක් එක් විෂය සඳහා ලබාදී ඇති ලකුණු වලින් අවම වශයෙන් 40%ක් සහ සමස්ත ලකුණු එකතුවෙන් අවම වශයෙන් 50%ක් ලබාගෙන තිබිය යුතුය.

**(4) වැටුප :-** TRC 5.2 -Rs. 105,101 (10x2112) -(10x2816) -(10x3519) -(10x4223) – 231,801. මෙම තනතුර සඳහා සියලුම නව පත්වීම් මෙම රැකියා කාණ්ඩයේ II ශ්‍රේණියට අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ලැබේ.

**(5) පොදු කොන්දේසි :**

1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පත්කිරීම් කාණ්ඩයේ VI වන පරිච්ඡේදයේ 77 වන වගන්තිය ප්‍රකාරව මෙම පත්වීම වසරක වැඩ බලන කාලයකට යටත් වේ.
2. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
3. අයදුම්පත් භාරගැනීම සඳහා නියම කර ඇති අවසන් දිනයට පෙර, ඉහත සඳහන් කර ඇති සියලුම අවශ්‍ය සුදුසුකම් අයදුම්කරු විසින් සම්පූර්ණ කර තිබේ නම් පමණක්, ඔහු/ඇය මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලත් අයෙකු ලෙස සැලකේ.
4. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**අයදුම් කිරීමේ ක්‍රමය:**

අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතික කළ පිටපත් සහ අංශ ප්‍රධානියාගේ නිර්දේශය සමඟ, අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයට පෙර පාලන හා ආයතනික කටයුතු අංශයට ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2026.06.01 වේ.


**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**අංක .276**
**ඇල්විටිගල මාවත**
**කොළඹ 08**